# ජන අරගලයේ කලාකරුවෝ
# மக்கள் எழுச்சியில் கலைஞர்கள்
# Artists of the People's Movement

## 2022 ජූලි 09 ශ්‍රී ලංකාවට ඓතිහාසික දිනයක්

### ඒකාධිපතිත්වයේ සිට ප්‍රජාතන්ත්‍රවාදය දක්වා;
### විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරමු

2022 ජූලි 9 වනදා රටේ සෑම ප්‍රදේශයකින්ම මිලියන ගණනක් ශ්‍රී ලාංකිකයෝ කොළඹට රැස් වුනා. උග්‍ර ඉන්ධන හිඟය සහ රාජ්‍ය හා පෞද්ගලික ප්‍රවාහන සේවා කප්පාදු කිරීමට රජය ගත් පාපතර ප්‍රයත්නයන් හමුවේ නොසැලුනු පුරවැසියන්, අගනුවරට සැතපුම් ගණන් පයින් ඇවිද්ද. තමන්ට මුහුණ දෙන්නට සිදුවිය හැකි ආපදවේ අවධානමද නොතකා විශාල පිරිසක්, දුම්රිය, බස්රථ, ට්‍රක්, ලොරි, ආදී සියළු ආකාර ප්‍රවාහන ක්‍රම භාවිතා කොට අගනුවරට රැස්වූවා. සමහරුන් පැමිණියේ කුලියට ගත් වාහන වලින්.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ ගේ දුර්දන්ත පාලනයේ අන්ත අසාර්ථකත්වය පිළිබඳව තම අප්‍රසාදය ප්‍රකාශ කිරීමටත්, අගමැති රනිල් වික්‍රමසිංහ ට තම තනතුරින් වහාම ඉල්ලා අස්වන ලෙස බලකිරීමටයි මේ පිරිස අගනුවරට පැමිණියේ. අප්‍රතිහත ධෛර්යයෙන් හා අධිෂ්ඨානයෙන් පමණක් සන්නද්ධව පැමිණි මේ පිරිස, පොලිසිය සහ හමුදා භට පිරිස් දිගින් දිගටම එල්ල කළ නිර්ලජ්ජිත කඳුළු ගෑස් ප්‍රහාරයන්ට නිර්භීතව මුහුණ දුන්නා. ආයුධ සන්නද්ධ භට පිරිස් සමග කළ නිරායුධ සට්ටනය අවසානයේ, ජනාධිපති මන්දිරය, ජනාධිපති ලේකම් කාර්යාලය සහ අරලියගහ මන්දිරය අත්පත් කර ගැනීමට මේ පිරිස සමත් වූවා. මෙදින අගනුවර අරගලයට සමගාමීව දිවයිනේ බොහෝ ප්‍රදේශවල උද්ඝෝෂණ පැවැත්වුනා.

මෙම ඓතිහාසික දිනයේ දී මිලියන සංඛ්‍යාත සහෝදර පුරවැසියන් සමඟ නැගී සිටීමට හැකිවීම පිළිබඳව ජන අරගලයේ කලාකරුවන් වන අපට ඇත්තේ නිහතමානී ආඩම්බරයක්.

මෙම දැවැන්ත විරෝධතා හමුවේ කථානායකවරයාගේ ආරාධනයෙන්, පාර්ලිමේන්තුව නියෝජනය කරන පක්ෂ නායකයින් රැස්වී ජනාධිපතිවරයාට සහ අගමැතිට ඉල්ලා අස්වන ලෙසට ඉල්ලීමක් කර ඇති බව වාර්තා වෙනවා. පක්ෂ නායකයින්ගේ නිර්දේශයන්ට අවනත වෙන්නට ඔවුන් දෙදෙනාම "කැමැත්ත" ප්‍රකාශ කර තියෙනවා.

මේ රටේ මිලියන සංඛ්‍යාත පුරවැසියන්ගේ ජයග්‍රහණය සොරකම් කිරීමට, පාර්ලිමේන්තුවේ පක්ෂ නායකයින් විසින් ගන්නා ලද අවස්ථාවාදී උත්සාහයක් ලෙස අපි මෙම පියවර හෙළා දකිනවා. අපේ රට දිනෙන් දිනම බංකොලොත් භාවය කරා ලිස්සා ගියේ මෙම පාර්ලිමේන්තුව සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වූ වකවානුවක වග අප කිසි විටෙකත් අමතක නොකළ යුතුය. අපේ ආර්ථිකයේ කඩාවැටීම වැළැක්වීමට පියවර ගැනීමට, තමන් ජනතාව නියෝජනය කරනවා යැයි පාරම්බාන සියළුම පක්ෂ අපොහොසත් වුනා. දේශපාලන පක්ෂ නායකයින් කිසිවෙකු මේ අවාසනාවන්ත තත්ත්වයෙන් ගොඩඑන්නට තමන්ගේ ඡන්දදායකයින්ව ජනතා ව්‍යාපාරයක් ලෙස පෙල ගැස්සුවේ නැහැ. ඒ වෙනුවට ඔවුන් පැය ගණන් අර්ථ විරහිත වාද විවාදවල සහ විහිළු තහළුවල පැටලුනා. ජනතාව ආර්ථික ප්‍රපාතයෙන් ගලවා ගන්නට කටයුතු කරනවා වෙනුවට, ට්විටර් සහ වෙනත් සමාජ මාධ්‍ය වේදිකා මතින් තම තමන්ගේ දේශපාලන ප්‍රතිරූපය සහ තම පක්ෂයේ ප්‍රතිරූපය ඉහළ නංවා ගන්නට ඔවුන් උත්සුක වුනා.

නිරායුධ, අවිහිංසාවාදී සහ ප්‍රජාතන්ත්‍රවාදී ජනතා ව්‍යාපාරය තුළින් අපි ජූලි 9 වැනිදා අත්කර ගත්තේ ලාංකේය ඉතිහාසයේ පෙර නොවූ විරූ බලයක්. සර්වබලධාරී ජනාධිපතිතුමාට සිය තනතුරින් ඉල්ලා අස්වන්නට බල කරන සීමාවට පොදු ජනතාව අරගලය ඔසවා තැබුවා.

විධායක ජනාධිපතිවරයාට පැවරී ඇති අසාමාන්‍ය, අසීමිත බලතල හේතුවෙන් ශ්‍රී ලංකාව තුල වර්ථමානයේ පවතින්නේ ව්‍යවස්ථාපිත ඒකාධිපති පාලනයක් මිස අන් කිසිවක් නොවේ. 1979 දී ජේ. ආර්. ජයවර්ධන විසින් විධායක ජනාධිපති ක්‍රමය හඳුන්වා දුන් දින සිට ගතවූ වසර 43 ක කාලය තුළ, අපේ ජනතාව ශාපලත් පිරිසක් බවට පත්වී සිටිනවා. කෙසේ වෙතත්, මේ අත්පත් කරගත් ජයග්‍රහණය ස්ථාපිත කළ හැක්කේ විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීමෙන් පමණක් බව ජන අරගලයේ කලාකරුවන් වන අප විශ්වාස කරනවා. මේ ඒකාධිපති ප්‍රතිපාදන ඉවත් කිරීම අනිවාර්යයෙන් සිදුකොට ශ්‍රී ලංකාව තුල ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ක්‍රමයක් තහවුරු කරන ව්‍යවස්ථාවක් සකස් කිරීමට වහාම ක්‍රියාත්මක විය යුතු බව ජන අරගලයේ කලාකරුවන් වන අප තරයේ විශ්වාස කරනවා.

මේ කටයුත්ත ඉටු කිරීමට අපි පුළුල් සන්ධානයක් පිහිටුවන්නට බලාපොරොත්තු වෙනවා.

**2022 ජූලි 12 - කොළඹ**